# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 29 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 06/01/2024 පැය 1710

**මාධ්‍ය නිවේදනය**

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල පරිශ්‍රයෙහි ස්වයංක්‍රීයව මුහුණු හඳුනා ගැනීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම.**

ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට අධිතාක්ෂණය හා කෘතිම බුද්ධිය භාවිතා කරමින් ස්වයංක්‍රීයව මුහුණු හඳුනා ගැනීමේ පද්ධතියක් ( Automated Facial Recognition System ) ස්ථාපිත කිරීම ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මහතාගේ ප්‍රධානත්වයෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ගරු ලේකම් වියානි ගුණතිලක මහතා සහ වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගීත්වයෙන් 2024.01.06 වන අද දින කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේදී සිදු කරන ලදී.

නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ වූ මෙම පද්ධතිය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණු වනුයේ, අපරාධ සිදු කරන ලද සංවිධානාත්මක අපරාධකරුවන් සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විදේශ ගතව සිට අපරාධ මෙහෙයවීම, ව්‍යාජ ලේඛණ භාවිතා කර සකස් කරනු ලැබූ විදෙස් ගමන් බලපත්‍ර භාවිතා කරමින් රටින් පිටව යාම සහ නැවත දිවයිනට පැමිණ සැඟව සිට සංවිධානාත්මක අපරාධ සහ මත්ද්‍රව්‍ය ජාවාරම් වැලැක්වීම සඳහා එම අපරාධකරුවන් රටින් පිටව යාමේදී සහ නැවත පැමිණීමේදී ඔවුන් ස්වයංක්‍රීයව මුහුණු මඟින් හඳුනා ගෙන නීතියේ රැහැනට හසුකර ගැනීමයි.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල පරිශ්‍රයේ ස්ථාපිත කරන ලද මෙම ස්වයංක්‍රීයව මුහුණු හඳුනා ගැනිමේ පද්ධතිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිපාලනයට යටත්ව ක්‍රියාත්මක වන අතර, වෙස් වලාගෙන හෝ අවිධිමත් ලෙස පැමිණෙන ඕනෑම සැකකරුවෙකු හඳුනා ගැනීමේ හැකියාව පරිගණක මඟින් සිදු කල හැකි අතර, සංවිධානාත්මක අපරාධ සහ මත්ද්‍රව්‍ය ජාවාරම මැඩලීම තවදුරටත් සාර්ථකව සිදු කිරීමට මෙමඟින් හැකියාව ලැබෙනු ඇත.

මෙම පද්ධතිය ස්ථාපිත කිරිමේ අවස්ථාවට ගුවන් තොටුපල හා ගුවන් සේවා ගරු සභාපති ඉංජිනේරු අතුල ගල්කැටිය, බස්නාහිර පළාත් උතුර භාර නියෝජ්‍ය පොලිස්පති රොහාන්

ප්‍රේමරත්න, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහ යන මහත්වරු ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් සහභාගී විය.